සියලුම හිමිකම් ඇවිරිණි. All Rights Reserved]

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2025
General Certificate of Education (Adv. Level) Practice Test - 2025

භූගෝල විද්‍යාව - I **Geography - I**	22	S	I	ශ්‍රේණිය 13 Grade 13

පැය තුනයි
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය :.....

උපදෙස්:

1. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ. **I කොටස** බහුවරණ ප්‍රශ්න **40** කින් සමන්විත වන අතර, ඒවාට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සැපයිය යුතුය.
2. **I** කොටසේ නිවරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
3. II කොටසේ ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතුය.
4. **III** කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතුය.
5. **I , II** හා **III** කොටස් වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දිය යුතුය.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

	ප්‍රශ්න අංකය	ලකුණු
I කොටස	1 - 40	
II කොටස	1	
	2	
III කොටස	3	
	4	
	5	
	6	
එකතුව		

	අත්සන	සංකේත අංකය
1 වන පරීක්ෂක		
2 වන පරීක්ෂක		
අතිරේක ප්‍රධාන පරීක්ෂක		
ප්‍රධාන පරීක්ෂක		
ගණිත පරීක්ෂක		

I කොටස

- එක් එක් ප්‍රශ්නයට අදාළ නිවරදි පිළිතුර අඩංගු වරණය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

01. කිසියම් දත්ත ව්‍යාප්තියක දත්ත සුළු ගණනක් ඇති විටදී මධ්‍යනය ගණනය කිරීම සඳහා වඩාත්ම සුදුසු සූත්‍රය වනුයේ පහත ඒවායින් කවරක්ද?

1. $\frac{\varepsilon fx}{n}$ 2. $\frac{\varepsilon fxn}{n}$ 3. $\frac{\varepsilon x}{n}$ 4. $\frac{(\varepsilon fd)c}{n}$ 5. $\frac{(\varepsilon x)m}{n}$

(.....)

02. භූගෝලීය තොරතුරු පද්ධතිවල (GIS) භාවිතා කරන ආදාන උපාංගයක් නිවරදිව දැක්වෙන පිළිතුර වනුයේ,

1.මුද්‍රණ යන්ත්‍රය 3.සන්දර්ශකය 5.මධ්‍ය සැකසුම් ඒකකය
2.මෘදුකාංග 4.සුපරීක්ෂණය

(.....)

03. 1:50000 පරිමාණයේ මෙට්‍රික් සිතියමක අධිවේගී මාර්ග (Expressway) දැක්වෙනුයේ කිනම් වර්ණයකින්ද?

1.රතු 2.දම් 3.කළු 4.තැඹිලි 5.කහ

(.....)

04. ජාල රේඛයක වැඩිම උසකින් යුතු සිරස් ස්ථම්භය මඟින් නිරූපණය වනුයේ දත්ත සමූහයේ,

1.මාතයයි. 3.මධ්‍යනයයි. 5.ඉහළ චාතුර්ථකයයි.
2.මධ්‍යස්ථයයි. 4.පරාසයයි.

(.....)

05. වර්ෂ 2000 සිට 2010 දක්වා කාලය තුල යල සහ මහ කන්න දෙකෙහි වී නිෂ්පාදන ප්‍රමාණය දැක්වීම සඳහා වඩාත්ම යෝග්‍ය ප්‍රස්තාරික ක්‍රමය වනුයේ,

1.තීරු සහ රේඛා ඒකාබද්ධ ප්‍රස්තාරයයි. 4.සක් සටහනයි.
2.ද්විත්ව තීරු ප්‍රස්තාරයයි. 5.සරල රේඛා ප්‍රස්තාරයයි.
3.තීරු ප්‍රස්තාරයයි.

(.....)

06. ආරෝහණ පිළිවෙලට සකසන ලද සංඛ්‍යා 50 කින් යුත් දත්ත ව්‍යාප්තියක ඉහළ චාතුර්ථකය පිහිටා තිබෙන්නේ,

1.පිළිවෙලින් 38 සහ 39 වන ස්ථාන අතරය. 4.පිළිවෙලින් 25 සහ 26 වන ස්ථාන අතරය.
2.පිළිවෙලින් 28 සහ 29 වන ස්ථාන අතරය. 5.පිළිවෙලින් 15 සහ 16 වන ස්ථාන අතරය.
3.පිළිවෙලින් 25 වන ස්ථානයේය.

(.....)

07. භූ ලක්ෂණ සිතියමක දැක්වෙන සංස්කෘතික ලක්ෂණ පමණක් ඇතුලත් වරණය තෝරන්න.

1.ජනාවාස, පාෂාණ උද්ගතය, ඓතිහාසික ස්ථාන 4.පොදු සේවා ගොඩනැගිල්ල, කලපු, මහාමාර්ග
2.ත්‍රිකෝණාමිතික ස්ථානය, ගංගාව, ගෙවතු 5.භූමි පරිහරණය, වාරිමාර්ග, ජනාවාස
3.වනාන්තර, අවතල බෑවුම, මහා මාර්ග

(.....)

08. කිසියම් ප්‍රදේශයක ආයතගාමී නිමින සහ තීර්යක් නිමින පිහිටා තිබෙන විටදී නිර්මාණය වන ජලවහන ලක්ෂණය වනුයේ පහත ඒවායින් කවරක්ද?

1. ශාඛීය ජලවහන රටාව
2. අරීය ජලවහන රටාව
3. සවිරාම ජලවහන රටාව
4. ජාලාකාර ජලවහන රටාව
5. වලයාකාර ජලවහන රටාව

(.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

09. ශ්‍රී ලංකාවේ 1:50000 පරිමාණයේ සිතියම් ජාලයෙහි අංක 71 සහ 72 යන සිතියම් පත්‍ර එකතු කර එක් පත්‍රයක් වශයෙන් මුද්‍රණය කර ඇත. එම සිතියම් පත්‍ර යුගලය වනුයේ,

1.අම්පාර සහ මොණරාගල
2.මහියංගණය සහ පදියතලාව
3.පොතුවිල් සහ කෝමාරි
4.කෝමාරි සහ තම්පඩ්ඩි
5.කෝමාරි සහ පානම

(.....)

10. 1:50000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියමක ඇති ජාතික බණ්ඩාංක සැලැස්මෙහි එක් කොටුවක විශාලත්වය වනුයේ,

1.ව.සෙ.මී 25 කි.
2.ව.සෙ.මී 50 කි.
3.ව.සෙ.මී 75 කි.
4.ව.සෙ.මී 100 කි.
5.ව.සෙ.මී 10 කි.

(.....)

11. දත්ත වැලක සීමාන්තික අගයන් දෙක අතර පිහිටි දත්ත පිළිබඳව අදහසක් දැක්වෙනුයේ,

1.පරාසය මඟිනි.
2.මධ්‍යස්ථය මඟිනි.
3.අන්තර් චාතුර්ථක පරාසය මඟිනි.
4.මධ්‍යනය මඟිනි.
5.මාතය මඟිනි.


(.....)

12. 1951 දී පිහිටවනු ලැබූ පැසිපික් ආසියා සංචාරක සංගමයේ මූලස්ථානය පිහිටියේ,

1.ඩකා නගරයේය.
2.හොනලුලු නගරයේය.
3.මුම්බායි නගරයේය.
4.නිව්යෝර්ක් නගරයේය.
5.මැනිලා නගරයේය.

(.....)

13. මෙම රූප සටහනේ දැක්වෙන නැමි කඳු වර්ග පිළිවෙලින් නම් කරන්න.



1.A සමමිතික නැම්ම B අසමමිතික නැම්ම C ඔත් නැම්ම
2.A අසමමිතික නැම්ම B ඔත් නැම්ම C ඒකානති නැම්ම
3.A අසමමිතික නැම්ම B ඒකානති නැම්ම C සමානති නැම්ම
4.A අසමමිතික නැම්ම B ඒකානති නැම්ම C ඔත් නැම්ම
5.A අසමමිතික නැම්ම B පැති නැම්ම C ඔත් නැම්ම

(.....)

14. ලතින් ඇමරිකානු කලාපයේ ඉහළම නාගරික ප්‍රතිශතයක් සහිත රටවල් පමණක් ඇතුලත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

1.බ්‍රසීලය, ගයනාව, කොළොම්බියාව, චිලී
2.වෙනිසියුලාව, හයිටිය, චිලී, පීරූ
3.වෙනිසියුලාව, චිලී, උරුගුවේ, ආජන්ටිනාව
4.බ්‍රසීලය, චිලී, පීරූ, ගයනාව
5.කොළොම්බියාව, මෙක්සිකෝව, ආජන්ටිනාව, පීරූ

(.....)

15. කොළඹ පුරවර ප්‍රදේශය සමන්විත වනුයේ,

1.කොළඹ මහ නගර සභා සීමාවෙනි.
2.බස්නාහිර පළාතෙනි.
3.කොළඹ දිස්ත්‍රික්කයෙනි.
4.කොළඹ සහ කළුතර දිස්ත්‍රික්කයෙනි.
5.කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයෙනි.

(.....)

16. ජාත්‍යන්තර හා කලාපීය භූමිකම්පා සහ පෙර අනතුරු ඇඟවීමේ පද්ධතිය හා සම්බන්ධ වී ඇති ආයතනය වනුයේ මින් කුමක්ද?

1.කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
2.ආපදා කළමණාකරන මධ්‍යස්ථානය
3.භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය
4.ජාතික ජලජ සම්පත් පර්යේෂණ ආයතනය
5.ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය.

(.....)

17. ශ්‍රී ලංකාවේ භූමියේ පිහිටා තිබෙන පාෂාණ ස්කන්ධ වලින් වැඩි ප්‍රමාණයක් නිර්මාණය වී තිබෙන්නේ,

1.මයෝසීන යුගයේය.
2.ප්ලයිස්ටෝසීන යුගයේය.
3.හෙලෝසීන යුගයේය.
4.ප්‍රාග් කේම්බ්‍රිය යුගයේය.
5.ජුරාසික යුගයේය.

(.....)

18. ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින කලාපයේ ඉහළම නාගරීකරණයක් වාර්තා වනුයේ,

1.ආසියාවේය.
2.අප්‍රිකාවේය.
3.උතුරු ඇමරිකාවේය.
4.ලතින් ඇමරිකාවේය.
5.යුරෝපයේය.

(.....)

19. පෘථිවි වායු ගෝලයේ සුළං සංසරණ රටාව පිළිබඳව මුලින්ම අධ්‍යනය කළ දේශගුණ විද්‍යාඥයින් පමණක් ඇතුලත් වරණය තෝරන්න.

1.ඔස්ටින් මිලර්, තෝන්වෙයිට්, ට්‍රැවතා
2.ඔස්ටින් මිලර්, විලැඩිමීර් කෙපන්, රොස්බි
3.රොස්බි, ෆෙරල්, හැඩ්ලි
4.රොස්බි, ඔස්ටින් මිලර්, විලැඩිමීර් කෙපන්
5.ට්‍රැවතා, තෝන්වෙයිට්, ඔස්ටින් මිලර්

(.....)

20. පහතින් දැක්වෙන විල් අතරින් වඩාත්මක තාවකාලික විලක් වනුයේ,

1.මුඛ විල 2.ගිරි විල 3.දුනු විල 4.අශ්වලාඩම් විල 5.ප්ලායා විල

(.....)

21. වායු ගෝලයේ ආර්ද්‍රතාවය මිනුම් කිරීම සඳහා භාවිතා කරනු ලබන්නේ,

1.බැරෝ මීටරයයි.
2.අනිලමානයයි.
3.හයිග්‍රෝ මීටරයයි.
4.බෝෆට් මීටරයයි.
5.උෂ්ණත්ව මානයයි.

(.....)

22. පොළෝතලය කරා ළඟා වන සූර්ය විකිරණයෙන් පෘෂ්ඨයට අවශෝෂණය නොවීම නිසා නැති වී යන සූර්ය විකිරණ ප්‍රමාණය හඳුන්වනුයේ,

1.පරාවර්තනය යනුවෙනි.
2.විකිරණය යනුවෙනි.
3.ගුප්ත තාපය යනුවෙනි.
4.ඇල්බිඩෝව යනුවෙනි.
5.සංනයනය යනුවෙනි.

(.....)

23. ශ්‍රී ලංකාවේ සිමෙන්ති, සීනි, කඩදාසි සහ උළු ගඩොල් ආදී කර්මාන්ත වල ස්ථානගත වීම වඩාත් නිවරදි අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1.වාලච්චේන, කන්තලේ, උඩවලව, පුල්මුඩේ
2.ඇඹිලිපිටිය, අනුරාධපුරය, කන්තලේ, රත්නපුර
3.කන්කසන්තුරේ, සෙවනගල, ඇඹිලිපිටිය, බංගදෙණිය
4.රත්නපුර, අනුරාධපුර, වාලච්චේන, බංගදෙණිය
5.ගිංතොට, කැකිරාව, මාතර, බෝගල

(.....)

24. මහවැලි ජනාවාසයක ධූරාවලියේ ඉහළම ස්ථානය හිමිකරගනු ලබන්නේ,

1.ප්‍රාදේශීය මධ්‍යස්ථානයයි.
2.නගර මධ්‍යස්ථානයයි.
3.ග්‍රාම මධ්‍යස්ථානයයි.
4.මහ නගරයයි.
5.පුරවරයයි.

(.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki


25. එල්නිනෝ තත්වය ඇති කිරීම කෙරෙහි බලපාන සාධකය වනුයේ,

1.නැගෙනහිර පැසිපික් සාගරය උණුසුම් වීමෙන් අසාමාන්‍ය කාළගුණික රටාවක් නිර්මාණය වීම
2.අත්ලන්තික් සාගරයේ අසාමාන්‍ය කාළගුණික රටාවක් ඇති වීම
3.පැසිපික් සාගරයේ කාළගුණික රටාවේ දෛනිකව සිදුවන වෙනස් වීම
4.පැසිපික් සාගරයේ කාළගුණික රටාවේ සෘතුමය වශයෙන් සිදු වන වෙනස් වීම
5.අත්ලන්තික් සාගරයේ කාළගුණික රටාව සෘතුමය වශයෙන් වෙනස් වීම (.....)

26. ප්‍රාථමික සංසරණයට අයත්වන සුළං පද්ධති පමණක් ඇතුලත් වන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

1.වෙළඳ සුළං, බටහිර සුළං, මෝසම් සුළං
2.කටබැටික් සුළං, යල් සුළං, මෝසම් සුළං
3.වෙළඳ සුළං, බටහිර සුළං, ධ්‍රැව සුළං
4.වාසුළි, පිළි වාසුළි, කොඩයිකානල් සුළං
5.වාසුළි, පිළි වාසුළි, මෝසම් සුළං (.....)

27. A , B සහ C වශයෙන් හුණුගල් ආශ්‍රිත භූ රූප තුනක් පහත රූප සටහනෙහි දැක්වේ එම ලක්ෂණ තුන නිවරදිව සඳහන් වන්නේ කවර පිළිතුරෙහිද ?



1.(A) හිරි ලඹ (B) හිරි ටැඹ (C)ස්ථම්භය
2.(A) හරි ටැඹ (B) හිරි ලඹ (C)ස්ථම්භය
3.(A) ස්ථම්භය (B) හිරි ලඹ (C)හිරි ටැඹ
4.(A) හරි ලඹ (B) ස්ථම්භය (C)හිරි ටැඹ
5.(A) ලැපියේස් (B) ඩොලයින (C)හිරි ටැඹ (.....)

28. ජන සංඛ්‍යාවේ විශාලත්වය අනුව මහද්වීප පෙළ ගැස්වූ විටදී අවරෝහණ පිළිවෙලින් නිවරදිව දැක්වෙනුයේ,

1.ආසියාව, උතුරු ඇමරිකාව, යුරෝපය, අප්‍රිකාව, දකුණු ඇමරිකාව, ඕස්ට්‍රේලියාව
2.ආසියාව, දකුණු ඇමරිකාව, යුරෝපය, අප්‍රිකාව, උතුරු ඇමරිකාව, ඕස්ට්‍රේලියාව
3.ආසියාව, අප්‍රිකාව, යුරෝපය, උතුරු ඇමරිකාව, දකුණු ඇමරිකාව, ඕස්ට්‍රේලියාව
4.ආසියාව, අප්‍රිකාව, යුරෝපය, උතුරු ඇමරිකාව, දකුණු ඇමරිකාව, ඇන්ටාටිකාව
5.ආසියාව, යුරෝපය, අප්‍රිකාව, දකුණු ඇමරිකාව, උතුරු ඇමරිකාව, ඕස්ට්‍රේලියාව (.....)

29. ලෝකයේ පෙට්‍රෝලියම් නිෂ්පාදනය සහ වෙළඳාම පාලනය කරනු ලබන ප්‍රධාන සමාගම් පමණක් ඇතුලත් වන පිළිතුර තෝරන්න.

1.රෝයල් ඩච් ෂෙල් සමාගම, එක්සෝන් මොබිල් සමාගම, සෞදි ඇරම්කෝ සමාගම, මිට්සුයි සමාගම
2.මොන්සැන්ටෝ සමාගම, එක්සෝන් මොබිල් සමාගම, සෞදි ඇරම්කෝ සමාගම, ටෝටල් සමාගම
3.රෝයල් ඩච් ෂෙල් සමාගම, එක්සෝන් මොබිල් සමාගම, යුනිලීවර් සමාගම, ටෝටල් සමාගම
4.මොන්සැන්ටෝ සමාගම, එක්සෝන් මොබිල් සමාගම, සෞදි ඇරම්කෝ සමාගම, යුනිලීවර් සමාගම
5.රෝයල් ඩච් ෂෙල් සමාගම, එක්සෝන් මොබිල් සමාගම, සෞදි ඇරම්කෝ සමාගම, ටෝටල් සමාගම (.....)

30. නාගරීකරණ දර්ශකය ගණනය කරනු ලබන්නේ,

1.නාගරික ජන සංඛ්‍යාවේ වාර්ෂිකව වර්ධනය වන ප්‍රමාණයේ ප්‍රතිශතය මගිනි.
2.වාර්ෂිකව නගරය තුළ වර්ධනය වන නාගරික ජන සංඛ්‍යාව මගිනි
3.ග්‍රාමීය සහ නාගරික ජන සංඛ්‍යාවේ වෙනස මගිනි
4.නාගරික ජන සංඛ්‍යාව මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙනි
5.මධ්‍ය වාර්ෂික මුළු ජන සංඛ්‍යාව නාගරික ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙනි (.....)

31. නාගරික ජනාවාස ධුරාවලිය නිවරදි අනුපිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න.

1.මහ නගරය, පුරවරය, නාගරික සමූහිතය සහ නගර යාය
2.නගරය, පුරවරය, නගර යාය සහ නාගරික සමූහිතය
3.මහ නගරය, පුරවරය, නගර යාය සහ නාගරික සමූහිතය
4.මහ නගරය, නාගරික සමූහිතය, නගර යාය සහ පුරවරය
5.කුඩා නගරය, නගරය, මහ නගරය සහ පුරවරය (.....)

32. තැටි තල කිඳා බසින කලාපයක් පිහිටනුයේ,

1.එකිනෙකට අපසරණය වන සාගරික තැටිතල අතරය
2.එකිනෙකට අභිසරණය වන සාගරික සහ මහද්වීප තැටි තල අතරය
3.එකිනෙකට අපසරණය වන මහද්වීප තැටිතල අතරය
4.ආංශික තැටිතල අතරය
5.අභිසරණ තැටි මායිම් අතරය

(.....)

33. පෘථිවි වායුගෝලයේ ''සාමාන්‍ය සංසරණය'' ක්‍රියාත්මක වීමේදී බලපාන සාධක දැක්වෙන වරණය තෝරන්න.

1.එක් එක් අක්ෂාංශ වලදී ඇතිවන කේන්ද්‍රපසාරී බලයේ වෙනස් කම්
2.විවිධ අක්ෂාංශ වලදී කොරියෝලිස් බලයේ ඇතිවන වෙනස්කම්
3.පහළ අක්ෂාංශ ප්‍රදේශවල ඇති වන ඝර්ශණ බලය
4.අක්ෂාංශගතව වැඩි හා අඩු පීඩන තීර වල පිහිටීම
5.ගොඩබිම සහ සාගරයේ පීඩන අනුක්‍රමණය වෙනස් වීම (.....)

34. ආග්නේය සහ අවසාධිත පාෂාණ විපරිතකරණයෙන් නිර්මාණය වන පාෂාණ වර්ග දෙකක් වඩාත් නිවරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

1.නයිස් සහ කිරිගරුඬ
2.නුණුගල් සහ ඩොලමයිට්
3.ග්‍රැනයිට් සහ කිරිගරුඬ
4.ගැබ්රෝ සහ ඩොලමයිට්
5.බැසෝල්ට් සහ කිරිගරුඬ

(.....)

35. ශ්‍රී ලංකාවේ දේශගුණය කෙරෙහි බලපාන ස්ථානීය සාධකයක් සහ ගෝලීය සාධකයක් නිවරදි අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1.දූපතක් වශයෙන් පිහිටීම සහ මධ්‍ය කඳුකරයේ පිහිටීම
2.දියවැල් වල බලපෑම සහ මධ්‍ය කඳුකරයේ පිහිටීම
3.කඳු බාධක සහ ඉන්දියන් සාගරයේ පිහිටීම
4.කඳු බාධක සහ අන්තර් නිවර්තන අභිසරණ කලාපයේ බලපෑම
5.අන්තර් නිවර්තන අභිසරණ කලාපයේ බලපෑම සහ සමක උප නිවර්තන ජෙට් ප්‍රවාහයේ බලපෑම (.....)

36. ආපදා කළමණාකරන චක්‍රයේ ප්‍රධාන අදියර හතර පිළිවෙලින් නිවරැදිව දැක්වෙන පිළිතුර වනුයේ,

1.පෙර සූදානම, ආපදාවට ප්‍රතිචාර දැක්වීම, යථා තත්වයට පත්කිරීම, ආපදාවය පුරෝකථනය කිරීම
2.පෙර සූදානම, අවම කිරීම, යථා තත්වයට පත් කිරීම, ආපදාවයට මුහුණ දීම
3.ආපදාවයට මුහුණ දීම, අවම කිරීම, පෙර සූදානම, යථා තත්වයට පත්කිරීම
4.ආපදාවයට මුහුණ දීම, පෙර සූදානම, අවම කිරීම, යථා තත්වයට පත්කිරීම
5.පෙර සූදානම, ආපදාවයට ප්‍රතිචාර දැක්වීම, යථා තත්වයට පත්කිරීම, අවම කිරීම (.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

37. කොණ්ඩලයිට් පාෂාණ සහ චානෝකයිට් පාෂාණ දක්නට ලැබෙන්නේ,

1.විජයානු සංකීර්ණයේය
2.උස්බිම් සංකීර්ණයේය
3.වන්නි සංකීර්ණයේය
4.මයෝසීන හුණුගල් තීරයේය
5.වෙරළ කලාපයේය

(.....)

38. නිවර්තන වර්ෂා වනාන්තර බියෝමයට ආවේණික ලක්ෂණයක් නොවන්නේ,

1.වර්ෂය පුරා පැතිරුණ වර්ෂාපතනය
2.ඉහළ ජෛව විවිධත්වය
3.ශාක ස්ථරීභවනය
4.වර්ෂය පුරා පැතිරුණ ඒකාකාරී උෂ්ණත්වය
5.පතනශීලී ශාක පැවතීම

(.....)

39. පොළෝ තලයේ සිට ඉහළට ගමන් කරන විටදී වායු ගෝලය පැහැදිලි ස්තර හතරකට වෙන් කර ඇත. එම බෙදීමට පාදක කරගනුයේ,

1.පීඩනයේ සිදු වන වෙනස් වීමයි
2.උෂ්ණත්වයේ සිදු වන වෙනස් වීමයි
3.වායු සංයුතියේ සිදු වන වෙනස් වීමයි
4.උෂ්ණත්වය සහ පීඩනයේ සිදු වන වෙනස් වීමයි
5.උෂ්ණත්වය සහ ආර්ද්‍රතාවයේ සිදු වන වෙනස් වීමයි (.....)

40. අප්‍රිකා මහද්වීපයේ අඩුම නාගරීකරණ මට්ටමක් වාර්තා වන රටවල් දෙකක් නිවරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

1.ගැබෝන් සහ කොංගෝව
2.කෙන්යාව සහ ටැන්සානියාව
3.බුරුන්ඩි සහ මලාවි
4.රියුනියන් සහ කොංගෝව
5.උගන්ඩාව සහ මලාවි

(.....)

සියලුම හිමිකම් ඇවිරිණි. All Rights Reserved]

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province

සළාත් අධ්‍යාපන දෙසාර්තමේන්තුව, නැගෙනහිර සළාත
Provincial Department of Education, Eastern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2025
General Certificate of Education (Adv. Level) Practice Test - 2025

භූගෝල විද්‍යාව - I **Geography - I**	22 S I	ශ්‍රේණිය 13 Grade 13

උපදෙස්

- II කොටසෙහි ප්‍රශ්න **දෙකටම** පිළිතුරු සැපයිය යුතුය.
- III කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතුය.
- මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා 1:50000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියමක කොටසක්ද, ලෝක ආකෘති සිතියමක් සහ ප්‍රස්තාර කොළ දෙකක් ඔබට සපයා ඇත.

II කොටස

01. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50000 පරිමාණයේ මොණරාගල භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය අඩි 100 කි. එම සිතියම පදනම් කරගනිමින් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සැළකිය යුතුයි:

- **ප්‍රශ්න අංකය** සහ **අදාළ උප කොටස් වල අංක** පිළිතුරු පත්‍රයේ පැහැදිලිව සඳහන් කළ යුතුය.
- **පිළිතුරු සිතියමෙහි ලිවීම අවශ්‍ය නොවේ.**
- සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය **යුතු නොවේ**

i. A-B රේඛාව ඔස්සේ ඇති බෑවුමෙහි ස්වභාවය හැඳිනගෙන නම් කරන්න. (ලකුණු 01 යි)

ii. එම බෑවුමෙහි ස්වභාවය සමෝච්ච රේඛා ආධාරයෙන් හඳුනාගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

iii. C-D රේඛාව ඔස්සේ දක්නට ලැබෙන භෞතික ලක්ෂණය නිවරදිව නම් කරන්න. (ලකුණු 01 යි)

iv. සිතියම් ප්‍රදේශයේ ජලවහනයේ කැපී පෙනෙන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 04 යි)

v. ප්‍රදේශයේ ප්‍රධාන සේවා මධ්‍යස්ථානයක් ලෙස මොණරාගල නගරය කේන්ද්‍රගතවන පරිදි අංක 01 චතුරස්‍රය ඇඳ ඇත. එම චතුරස්‍රය තුල දැකිය හැකි පොදු සේවා පහසුකම් විස්තර කරන්න. (ලකුණු 03 යි)

vi. සිතියම් ප්‍රදේශයේ භූ විෂමතාවයේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 03 යි)

vii. A_4 ප්‍රධාන මාර්ගයේ ගමන් මඟ තීරණය වීම සඳහා ප්‍රදේශයේ භූ විෂමතාවය බලපා ඇති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

viii. සිතියම් ප්‍රදේශයේ නිරිත දිග කාර්තුවේ කෘෂිකාර්මික භූමි පරිභෝගය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

02. ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි සම්මත වර්ණ සහ සංකේත යොදාගනිමින් පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

- හැමර්ස්ලි කඳු වැටිය
- කොළරාඩෝ ගංගාව
- වික්ටෝරියා විල
- ජාවා දූපත
- කැරිබියන් මුහුදු
- හඩ්සන් සමුද්‍ර සන්ධිය
- යමාල් අර්ධද්වීපය
- 2025 වර්ෂයේ මාර්තු මාසයේදී ප්‍රබල භූ කම්පනයක් සිදු වූ අග්නිදිග ආසියානු රට
- 2025 වර්ෂයේදී අයරින් සුළිකුණාටුව බලපෑ යුරෝපීය රට
- ජාත්‍යන්තර අර්තාපල් පර්යේෂණායතනය පිහිටි නගරය

III කොටස

03. (I) භූ ලක්ෂණ සිතියම් සහ තේමා සිතියම් යනු මොනවාදැයි කෙටියෙන් දක්වන්න. (ලකුණු 04 යි)

(II) පහතින් දැක්වෙන එක් එක් තේමාවන් නිරූපණය කිරීමට යොදාගත හැකි සිතියම් විද්‍යාත්මක ක්‍රම **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(අ) ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව ජන ව්‍යාප්තිය

(ආ) ශ්‍රී ලංකාවේ වර්ෂාපතන ව්‍යාප්තිය


(ඉ) කිසියම් රටක අපනයන ප්‍රමාණය සහ දිශාව

(III) ඔබ ඉහත II හි නම් කළ සිතියම් විද්‍යාත්මක ක්‍රම වලින් **එකක්** තෝරාගෙන එහි ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 04 යි)

(IV) ඔබ ඉහත II හි තෝරාගත් සිතියම් විද්‍යාත්මක ක්‍රමයේ දුර්වලතා **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

04. (I) දුරස්ත සංවේදන (Remote Sensing) තාක්ෂණය යනු කුමක්ද ? (ලකුණු 02 යි)

(II) පහත රූපයේ දැක්වෙනුයේ දුරස්ත සංවේදන තාක්ෂණ ක්‍රියාවලිය සිදු වන ආකාරයයි. එහි අංක 1 සිට 6 දක්වා නම් කර ඇති අවස්ථා නම් කර ඒ ඇසුරින් දුරස්ථ සංවේදන ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)



(III) දුරස්ථ සංවේදන වේදිකා **දෙකක්** නම් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(IV) දත්ත රැස්කිරීමේ ශිල්පීය ක්‍රමයක් වශයෙන් දුරස්ථ සංවේදන තාක්ෂණයේ දැකිය හැකි ප්‍රයෝජන **තුනක්** තෝරාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

05. පහත වගුවේ දැක්වෙන්නේ 2016 වර්ෂයේදී දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පැවති කර්මාන්ත ආයතන සංඛ්‍යාවයි. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

කර්මාන්ත වර්ගය	ප්‍රමාණය
පතල් කැණීම	217
ආහාර, බීම වර්ග සහ දුම්කොළ	577
රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ	756
දැව, දැව භාණ්ඩ සහ ගෘහ භාණ්ඩ	464
කඩදාසි නිෂ්පාදන සහ මුද්‍රණ කටයුතු	36
එකතුව	2050

මූලාශ්‍රය - සංඛ්‍යාන අත්පොත

(I) 2016 වර්ෂයේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පැවති කර්මාන්ත ආයතන සංඛ්‍යාව නිරූපණය කිරීම සඳහා සක් සටහනක් නිර්මාණය කරන්න. (ලකුණු 05 යි)

(II) ඔබ නිර්මාණය කළ ප්‍රස්තාරය ඇසුරින් දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කර්මාන්ත ආයතන සංඛ්‍යාව බෙදී ගොස් ඇති ආකාරයේ කැපී පෙණෙන ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(III) දත්ත නිරූපණය කිරීම සඳහා භාවිතා කරන සක් සටහනෙහි ප්‍රයෝජන සහ දුර්වලතා **දෙක** බැගින් දක්වන්න. (ලකුණු 04 යි)

(IV) සංඛ්‍යා දත්ත ප්‍රස්තාරික ක්‍රම ඇසුරින් නිරූපණය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

06. පහත වගුවේ දැක්වෙන්නේ 1992 සිට 2005 දක්වා කාලයේදී ගන්නෝරුව කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානයේ වාර්තා වූ වර්ෂාපතන දත්තයන්ය. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ගන්නෝරුව කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානයේ වර්ෂාපතන දත්ත

වර්ෂය	**වර්ෂාපතනය (මි.මී)**
1992	81.0
1993	75.2
1994	64.1
1995	63.2
1996	82.2
1997	81.5
1998	80.3
1999	94.2
2000	73.4
2001	64.9

මූලාශ්‍රය - කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


Past Papers Wiki

(I) ඉහත වගුවේ දත්ත ඇසුරින් මධ්‍යන වර්ෂාපතනය ගණනය කරන්න. (ලකුණු 02 යි)

(II) එක් එක් වර්ෂයේ වර්ෂාපතනයේ අපගමනය ගණනය කරන්න. (ලකුණු 04 යි)

(III) ඉහත II කොටසේ ගණනය කළ අපගමන දත්ත ඇසුරින් අපගමන ප්‍රස්තාරය නිර්මාණය කරන්න. (ලකුණු 06 යි)

(IV) ඔබ නිර්මාණය කළ අපගමන ප්‍රස්තාරය සහ ගණනය කිරීම් ඇසුරින් ගන්නෝරුව කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානයේ වර්ෂාපතනයේ උපනතීන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලුම හිමිකම් ඇවිරිණි. All Rights Reserved]

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province Provincial Department of Education, Eastern Province Provincial Department of Education, Eastern Province Provincial Department of Educationපළාත්
අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province Provincial Department of Education, Eastern Province Provincial Department of Education, Eastern

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2025
General Certificate of Education (Adv. Level) Practice Test - 2025

භූගෝල විද්‍යාව - II
Geography - II

22 | S | II

ශ්‍රේණිය 13
Grade 13

පැය තුනයි
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස් : එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

I කොටස - භෞතික භූගෝල විද්‍යාව


01. (I) කාස්ට් භූ රූප යනු මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(II) කාස්ට් භූ රූප ලක්ෂණ නිර්මාණය වීමේදී භූගත ජලයේ කාර්ය භාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(III) ඔබ තෝරාගන්නා ඕනෑම කාස්ට් භූ රූප ලක්ෂණ **තුනක** නිර්මාණ ක්‍රියාවලිය රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(IV) කාස්ට් භූ දර්ශණයේ පවතින ආර්ථික වැදගත්කම් **තුනක්** තෝරාගෙන විස්තර කරන්න. (ලකුණු 06 යි)

02. (I) පහතින් දැක්වෙන පාංශු පැතිකඩෙහි අංක 01 සිට 04 දක්වා ඇති පාංශු මහල් නිවරදිව නම් කරන්න. (ලකුණු 02 යි)



(II) ඉහත පාංශු පැතිකඩෙහි අංක 01 සහ 02 යනුවෙන් දැක්වෙන පාංශු මහල් ආශ්‍රිත කැපීපෙනෙන ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(III) පාංශු බාදනය කෙරෙහි බලපාන මානව ක්‍රියාකාරකම් **තුනක්** තෝරාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(IV) අපිටී සම්පතක් ලෙස පසෙහි ඇති වැදගත්කම කරුණු **තුනක්** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

03. (I) ශ්‍රී ලංකාවේ බහුලව දැකිය හැකි ස්වභාවික උපද්‍රව **හතරක්** නම් කරන්න. (ලකුණු 06 යි)

(II) ඉහත I හි ඔබ නම් කළ ඕනෑම **එක්** උපද්‍රවයක් තෝරාගෙන එය තීව්‍ර වීමට බලපාන මානව ක්‍රියාකාරකම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(III) ශ්‍රී ලංකාවේ ආපදා කළමණාකරණයේදී පහතින් දැක්වෙන රාජ්‍ය ආයතන වලින් ඉටුවන කාර්ය භාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(ආ) කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

(IV) ශ්‍රී ලංකාවේ ආපදා කළමණාකරණ ක්‍රියාවලියේ පවතින දුර්වලතා **තුනක්** හඳුනාගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 06 යි)

04. (I) දේශගුණ පාලන කාරක **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(II) ඉහත I හි ඔබ නම් කළ දේශගුණ පාලන කාරක අතරින් ඕනෑම **දෙකක්** තෝරාගෙන ඒවා දේශගුණය පාලනය කිරීමට දායක වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(III) කෙපන්ගේ දේශගුණ වර්ගීකරණයෙහි Af ලෙස සංකේතවත් කර ඇති නිවර්තන දේශගුණ වර්ගයේ කැපී පෙනෙන ලක්ෂණ පහතින් දැක්වෙන මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.


(අ) ව්‍යාප්තිය

(ආ) උෂ්ණත්වය සහ වර්ෂාපතනය

(IV) දේශගුණය මානව කටයුතු කෙරෙහි බලපාන ආකාරය කරුණු **තුනක්** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

06. පහත ප්‍රස්තාරය තුල දැක්වෙන්නේ 1995 - 2035 කාල සීමාවේදී ආසියාවේ ජන සංඛ්‍යාව ආශ්‍රිත ප්‍රවණතාවයන්ය. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

(I) ඉහත ප්‍රස්තාරයට අනුව 1995 සිට 2035 දක්වා කාල සීමාවේදී තරුණ ජන සංඛ්‍යාව සහ මහළු ජන සංඛ්‍යාව ආශ්‍රයෙන් දක්නට ලැබෙන කැපී පෙනෙන ලක්ෂණ **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(II) ප්‍රස්තාරයේ දැක්වෙන මහළු ජන සංඛ්‍යාව හා සම්බන්ධ ලක්ෂණ ආසියානු රටවල සමාජ ආර්ථික වශයෙන් ගැටළු ඇතිකරන ආකාරය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(III) වර්තමාන ලෝකයේ බොහෝ රටවල වයස්ගත ජන සංඛ්‍යා ප්‍රමාණය ඉහළ යෑමට තුඩු දුන් සාධක **දෙකක්** තෝරාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(IV) මෑත කාලීනව ශ්‍රී ලංකාවේ පුමිතිරි අනුපාතයේ වෙනස් වීම මෙරට සමාජ ආර්ථික කටයුතු කෙරෙහි බලපා ඇති ආකාරය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

06. (I) ''නාගරීකරණය'' සහ ''නාගරික ජනාවාස'' යනු කුමක්දැයි කෙටියෙන් දක්වන්න. (ලකුණු 02 යි)

(II) ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ විශාල නාගරික ජනාවාස නිර්මාණය වීමට බලපෑ සාධක **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(III) නාගරීකරණ ක්‍රියාවලිය රටකට වැදගත් වන ආකාරය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(IV) සංවර්ධනය වෙමින් පවතින කලාපයේ රටවල නාගරීකරණය හේතුවෙන් පැන නැගී ඇති ගැටළු **දෙකක්** සහ ඒවා විසඳීමට ගෙන ඇති පියවර **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

07. (I) නිෂ්පාදන කර්මාන්ත යනු මොනවාදැයි නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(II) පහතින් දැක්වෙන සාධක නිෂ්පාදන කර්මාන්තයක් ස්ථානගත වීමේදී වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(අ) අමුද්‍රව්‍ය

(ආ) ශ්‍රමය

(III) නිෂ්පාදන කර්මාන්ත ස්ථානගත වීම ආශ්‍රිත මෑතකාලීන ප්‍රවණතා **තුනක්** තෝරාගෙන විස්තර කරන්න.

(ලකුණු 06 යි)

(IV) ඇඟලුම් කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක වන ආකාරය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

08. (I) ගෝලීයකරණය යනු කුමක්ද? (ලකුණු 02 යි)

(II) ගෝලීයකරණ ක්‍රියාවලිය වේගවත් කිරීමට දායක වන සාධක **තුනක්** තෝරාගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 06 යි)

(III) ගෝලීයකරණය සංවර්ධනය වෙමින් පවතින රටවලට සිදුකරන යහපත් සහ අයහපත් බලපෑම් **දෙක** බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(IV) ගෝලීයකරණය මගින් සංවර්ධනය වෙමින් පවතින රටවලට සිදුකරන අයහපත් බලපෑම් අවම කරගැනීමට එම රටවල් අපොහොසත් වී තිබෙන්නේ මන්දැයි කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province Provincial Department of Education, Eastern Province Provincial Department of Educationපළාත්
අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province Provincial Department of Education, Eastern Province Provincial Department of Education, Eastern

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2025
General Certificate of Education (Adv. Level) Practice Test - 2025

භූගෝල විද්‍යාව - I
Geography - I

පිළිතුරු පත්‍රය

I පත්‍රය (I කොටස)

ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය
01	3	11	1	21	3	31	5
02	4	12	2	22	4	32	2
03	2	13	4	23	3	33	4
04	1	14	3	24	2	34	1
05	2	15	2	25	1	35	4
06	1	16	3	26	3	36	5
07	5	17	4	27	5	37	2
08	4	18	1	28	4	38	5
09	3	19	3	29	5	39	2
10	4	20	5	30	4	40	3

II කොටස

01. (I) අවතල බෑවුම

(II) කඳු මුදුන ආසන්නයේ සමෝච්ච රේඛා එකිනෙකට සමීපව සහ කඳු පාමුල සමෝච්ච රේඛා එකිනෙකට දුරස්ව පිහිටා තිබීම.

(III) කඳු වැටිය/ දියබෙත්ම

(IV) සිතියම් ප්‍රදේශයේ බටහිර මායිම ආසන්නයේ ගලා බසින ප්‍රධාන ගංගාව පිළිබඳව විස්තර විය යුතුය. සිතියම් ප්‍රදේශයේ මැදින් පිහිටි කඳුකරයේ සිට ගලා යන අතු ගංගා පිළිබඳව විස්තර විය යුතුය. අතු ගංගා ආරම්භ වන ප්‍රදේශවල ශාඛීය ජලවහන ලක්ෂණ දැකිය හැකිය.

(V) පාසල - අධ්‍යාපන සේවාව

පොලිසිය - ආරක්ෂාව

තැපැල් කාර්යාලය - සන්නිවේදන සේවාව

(VI) සිතියම් ප්‍රදේශයේ මධ්‍ය කොටස විශාල කඳු වැටියකින් වැසී ඇති අතර ඒ වටා ප්‍රදේශය පහත් බිමක් වශයෙන් පවතී. ඉහළම උන්නතාංශය සහ පහළම උන්නතාංශය පිළිබඳව දැක්විය යුතුය.

(VII) ප්‍රධාන මාර්ගය බටහිර අර්ධයේ සිට නැගෙනහිර අර්ධය දක්වා විහිදී යන අතර සිතියම් ප්‍රදේශයේ මැදින් පිහිටි කඳු කරය ඊට බාධා වී තිබේ. ඒ නිසා මාර්ගය බටහිර මායිමෙන් ප්‍රදේශයට පිවිසී උතුරු දිශාවට ගමන්කර නැවත නැගෙනහිර මායිම දක්වා පිවිසේ.

(VI) ගෙවතු, වී, රබර් ආදී බෝග වගාවන්ගේ ව්‍යාප්තිය පිළිබඳව විස්තර කළ යුතුය

02. සම්මත සංකේත සහ වර්ණ භාවිතා කරමින් නිවරදිව ලකුණු කර ඇති සිතියම් සඳහා ලකුණු ලබා දෙන්න.

III කොටස

04. (I) කිසියම් ප්‍රදේශයක ඇති භෞතික ලක්ෂණ සහ සංස්කෘතික ලක්ෂණ යන දෙවර්ගයම සම්මත වර්ණ සංකේත භාවිතා කරමින් නිරූපණය කර ඇති සිතියම් භූ ලක්ෂණ සිතියම් වේ. කිසියම් එක් නිශ්චිත තේමාවක් යම් කිසි අවකාශීය ප්‍රදේශයක ව්‍යාප්තව ඇති ආකාරය නිරූපණය කර ඇති සිතියම් තේමා සිතියම් වේ.

(II) (අ) රේඛාංකිත සිතියම/ නිත් සිතියම

(අ) සම සංඛ්‍යා සිතියම

(ආ) ධාරා සටහන

(III) නිත් සිතියමෙහි ප්‍රයෝජන

විචල්‍යයේ අවකාශීය ව්‍යාප්තිය පැහැලිව නිරූපණය වීම.

නිත් වලට නිශ්චිත වටිනාකමක් පවතින නිසා ප්‍රමාණය පිළිබඳව අදහසක් ලැබීම

(IV)නිත් සිතියමෙහි දුර්වලතා

කුඩා පරිපාලන ඒකකයක් තුල නිත් ලකුණු කිරීමේදී ඒවා එකිනෙකට සම්බන්ධ වීමෙන් සිතියම අපහැදිළි වීම.

නිත් සිතියමක නිත් ලකුණු කිරීමේදී පරිපාලන ඒකක වල පවතින භෞතික ලක්ෂණ පිළිබඳව මනා අවබෝධයක් තිබිය යුතු වීම.

04.(I) කිසියම් දුරක පිහිටි වස්තූන් හෝ ක්‍රියාකාරීත්වයන් වෙත භෞතිකමය වශයෙන් ළඟා නොවී එම වස්තූන් හෝ ක්‍රියාකාරීවයන් දුර සිට හඳුනාගැනීම, ග්‍රහණය කර ගැනීම සහ අවබෝධකරගැනීම සිදු කරන තාක්ෂණය දුරස්ථ සංවේදන තාක්ෂණයයි.

(II) 1 - ශක්ති මූලාශ්‍රය

2 - සූර්ය විකිරණය

3 - වස්තුව

4- ශක්තිය සටහන් කර ගැනීම

5 - දත්ත සම්ප්‍රේෂණය

6 - දත්ත විශ්ලේෂණය

(III) භූමි පාදක වේදිකා

වාසර වේදිකා

අභ්‍යවකාශ වේදිකා

(IV) කාළගුණ විද්‍යා පුරෝකථන

ස්වභාවික විපත් අධ්‍යනය

වන සම්පත් කළමණාකරනය

යුධමය කටයුතු

05.(I) නිවරදි ගණනය කිරීම් සහිතව ප්‍රස්තාරය නිවරදිව නිර්මාණය කිරීඹඨ ළඹුණු ලබා දෙන්න.

(II) නිවරදි ලක්ෂණ සඳහා ලකුණු ලබා දෙන්න.

(III) ප්‍රයෝජන

සංයුතිය හඳුනාගත හැකි වීම

සංයුතීන් සන්සන්දනාත්මකව අධ්‍යනය කළ හැකි වීම

දුර්වලතා

නිර්මාණය අපහසු වීම

කාලීන වෙනස්කම් හඳුනා ගැනීම අපහසු වීම

(IV) පහසුවෙන් අවබෝධකර ගත හැකි වීම

කාලීන වෙනස්කම් සන්සන්දනාත්මකව අද්‍යනය කළ හැකි වීම

06.(I)(II)(III)නිවරදි ගණනය කිරීම් සහ නිවරදි ප්‍රස්තාරයට ලකුණු ලබා දෙන්න.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත

Provincial Department of Education, Eastern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2025

General Certificate of Education (Adv. Level) Practice Test - 2025

භූගෝල විද්‍යාව - II

I කොටස භෞතික භූගෝල විද්‍යාව

01 (I) නුණුගල් ස්තරයක් මත නිර්මාණය වී තිබෙන විවිධ විෂමතා ලක්ෂණ නුණු ගල් භූ රූප යනුවෙන් හඳුන්වයි. එවැනි භූ දර්ශණයක් කැපී පෙනෙන ආකරයට දැකිය හැකි වනුයේ ස්ලෝවිනියාවේ ඩිනරික් කාස්ට් ප්‍රදේශයේ බැවින් එය කාස්ට් භූ රූප යනුවෙන්ද හඳුන්වයි.

(II) භූ ගත ජලය ගමන් කිරීමේදී පාෂාණ වල සිදුවන පාෂාණ බන්ධනය, ඔක්ෂිකරණය, කාභනීකරණය සහ සජලකරණය යන ක්‍රියාවලි නිසා පාෂාණ ජීර්ණය වන ආකාරය පැහැදිලි කළ යුතුය.

(III) ලැපීස්, කුමුටු වල, දෝලිනා, උවාලා, පෝල්ජේ, හිරි ලඹ, හිරි ටැඹ, ස්ථම්භ ආදී භූ රූප ලක්ෂණ පිළිබඳව විස්තර කළ හැකිය.

(IV)සංචාරක කර්මාන්තය දියුණු කළ හැකි වීම.

කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය වශයෙන් වැදගත් වීම

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පස ආශ්‍රිත ගැටළු විසඳා ගැනීමට යොදාගත හැකි වීම.

02. (I) O මහල

Aමහල

B මහල

C මහල

(II) පාංශු පැතිකඩෙහි ප්‍රධාන පාංශු මහල වේ. O මහල තුල පවතින ශාක සත්ව කොටස් දිරාපත් වීමෙන් එකතු වන ඓන්ද්‍රීය ද්‍රව්‍ය මෙම මහල ආශ්‍රිතව බහුලව දැකිය හැකිය. එම නිසා මෙම මහල ඓන්ද්‍රීය ද්‍රව්‍ය වලින් පොහොසත් පාංශු මහලක් වශයෙන් සැළකිය හැකිය. එම නිසාම Aමහල කළු පැහැයක් ගෙන තිබේ. ශාක වල මූල මණ්ඩලය වැඩි වශයෙන් ව්‍යාප්තව ඇත්තේ Aමහල තුලය. පාංශු ජීවීන්ගේ ක්‍රියාකාරීත්වයද මෙහි වැඩිය. ක්ෂරණ ක්‍රියාවලිය සිදුවනුයේ මෙම මහල ආශ්‍රිතවය. කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරන්නේ Aමහල ය. පාංශු බාදනය ප්‍රබලව සිදුවන ප්‍රදේශ ආශ්‍රිතව ඉහළින්ම Aමහල දැකිය නොහැකිය.

(III) වනාන්තර විනාශ කිරීම.

අවිධිමත් කෘෂිකර්මාන්තය.

කඳු බෑවුම් ප්‍රදේශ වල පතල් කැනීම.

සල ගොවිතැන

(IV)සමහර ස්වභාවික විපත් පාලනය කර ගැනීම සඳහා (නාය යෑම්, ගං වතුර)

කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නංවා ගැනීම සඳහා

ජල සම්පත් සංරක්ෂණය කර ගැනීම සඳහා

ජෛව විවිධත්වය ආරක්ෂා කර ගැනීම සඳහා

03. (I) නාය යෑම්, ගං වතුර, අකුණු

(II) නාය යෑම් කෙරෙහි බලපාන සාධක

වනාන්තර විනාශ කිරීම

කඳු බෑවුම් වල සිදු කරන අවිධිමත් කෘෂිකර්මාන්තය.

පතල් කැනීම.

කඳු බෑවුම් ආශ්‍රිතව සිදු කරන මානව ඉදිකිරීම්.

(III) <u>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u>

අනතුරට ලක්වූ ජනතාව ඉවත්කර ගැනීම සහ මුදවා ගැනීම

ආරක්ෂක සහන කඳවුරු ස්ථාපනය කිරීම සහ ආහාර ආදී ද්‍රව්‍ය සැපයීම

සෞඛ්‍ය සහ සුභසාධන සේවාවන් සැපයීම

ආපදා කළමණාකරනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම

<u>කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව</u>

සුනාමි, සුළි සුළං, කුණාටු වැනි ස්වභාවික ආපදාවන් පිළිබඳව නොරතුරු ඉක්මණින් ලබා ගැනීම සහ පුරෝකථනය කිරීම.

ආපදා අවස්ථා පිළිබඳව පූර්ව දැනුම් දීම් ලබා දීම.

පැය 24 පුරාම සක්‍රීය සේවාවක් ලබා දීම.

(IV)රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය දුර්වල මට්ටමක පැවතීම.

පූර්ව අනතුරු ඇඟවීම් නිසි වේලාවට සිදු නොවීම.

ආපදාවන්ට මුහුණදෙන ආකාර පිළිබඳව ජනතාවගේ නොදැනුවත්භාවය.

තාවකාලික කඳවුරුවල පහසුකම් ප්‍රමාණවත් නොවීම.

ආපදා කළමණාකරනය සඳහා ප්‍රජා සහභාගීත්වය දුර්වල මට්ටමක පැවතීම.

අවතැන්වූවන් නැවත පදිංචි කරවීමට දීර්ඝ කාලයක් ගත වීම.

පෙර පුහුණු වැඩසටහන් ප්‍රමාණවත් නොවීම.

04. (I) සූර්ය විකිරණ තීව්‍රතාවය

අක්ෂාංශ අනුව සූර්ය විකිරණයේ පවතින වෙනස.

සාගර සහ ගොඩබිම් වල ව්‍යාප්තිය

සාගර ප්‍රවාහ

කඳු බාධක

(II) ඉහත සාධක වලින් ඕනෑම සාධක දෙකක් තෝරාගෙන පැහැදිලි කිරීමට ලකුණු ලබා දෙන්න.

(III)(අ) ව්‍යාප්තිය ඇමසන් නිම්නය, කොංගෝ ද්‍රෝණිය, නැගෙනහිර ඉංදීය දූපත්, බටහිර කොළොම්බියාව, නැගෙනහිර මැඩගස්කරය, නැගෙනහිර බ්‍රසීලය, ගයනාව.

(ආ) උෂ්ණත්වය සහ වර්ෂාපතනය

වර්ෂය පුරා පැතිරුණ ඒකාකාරී ඉහළ උෂ්ණත්වයක් පවතී. (සෙ.අං 18 ට වැඩිය)

ශීත ඍතුවක් නොමැත.

කැපී පෙනෙන වියළි ඍතුවක්ද නැත.

වර්ෂාපතනය වාෂ්පීකරණය ඉක්මවා යයි.

සෑම මාසයකම සෙ.මී 30 ඉක්මවන වර්ෂාපතනයක් ලැබේ.

II කොටස මානුෂ භූගෝල විද්‍යාව

05. (I) 1995 සිට 2035 කාලය තුලදී ආසියාවේ තරුණ ජන සංඛ්‍යා ප්‍රමාණය මිලියන 600 කට වඩා ඉහළ මට්ටමක ඇත.

1995 සිට 2035 දක්වා කාලය තුලදී වැඩිහිටි ජන සංඛ්‍යාව මිලියන 200 තරම් ප්‍රමාණයක සිට මිලියන 600 දක්වා ඉහළ යෑමක් දැකිය හැකිය.

(II) මහළු යැපෙන්නන් රැකබලා ගැනීම ගැටළුවක් වේ.

ඔවුන්ගේ සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව වෙනුවෙන් විශාල වියදමක් දැරීමට රජයට සිදු වේ.

විශ්‍රාම වැටුප් ගෙවීමට සිදු වේ.

(III)ආයු අපේක්ෂාව ඉහළ යෑම

මරණ අනුපාතය පහළ වැටීම.

(IV)රැකියා සම්බන්ධ ගැටළු නිර්මාණය වීම

සමහර රැකියා ක්ෂේත්‍ර සඳහා කාන්තා ශ්‍රමිකයින් පුහුණු කිරීමට සිදු වීම.

රට තුල ආරක්ෂාව සම්බන්ධ ගැටළු නිර්මාණය වීම.

06. (I) සීමිත භූමි ප්‍රදේශයක කාර්මික, වානිජ, වෙළඳාම, සේවා ආදී විවිධ කාර්යන් සඳහා විශාල ජන සංඛ්‍යාවක් ඒකරාශී වීමෙන් නිර්මාණය වී ඇති ජනාවාස නගරික ජනාවාසයක් යනුවෙන් හඳුන්වයි.

මූලික වශයෙන් ග්‍රාමීය ලක්ෂණ පෙන්නුම් කරන ජන සමාජයක් ප්‍රමුඛ වශයෙන් නාගරික ලක්ෂණ පෙන්නුම් කරන ජන සමාජයක් දක්වා පරිණාමය වීමේ අඛන්ඩ වූ ක්‍රියාවලිය නාගරීකරණයයි.

(II) රාජ්‍ය සහ පුද්ගලික අංශයට අයත් වන රැකියා බහුලව පැවතීම.

වෙළඳ කටයුතු වල කේන්ද්‍රස්ථානයක් වීම.

යටිතල පහසුකම් සහ සේවා පහසුකම් සංවර්ධනය වී තිබීම.

(III)රටක කාර්මික සංවර්ධනයට නාගරීකරණය හේතු වේ.

රැකියා නිර්මාණය වීම.

ග්‍රාමීය ප්‍රදේශ වල ආර්ථික සංවර්ධනය කෙරෙහිද නාගරීකරණය හේතුවේ.

විද්‍යාත්මක දැනුම හා තාක්ෂනය දියුණු වීම

(IV)නාගරික තදබදය, නිවාස ගැටළුව, ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටළුව

07. (I)මිනිසාගේ දැනුම, බුද්ධිය මෙහෙයවා නිෂ්පාදන සාධක සමග අමුද්‍රව්‍ය එකක් හෝ කීපයක් භාවිතා කරමින් මිනිසාගේ විවිධ කාර්යන් පහසු කරගැනීම සඳහා අවශ්‍ය නිමි හෝ අර්ධ නිමි භාණ්ඩ නිපදවීම නිෂ්පාදන කර්මාන්ත යනුවෙන් හඳුන්වයි. අමුද්‍රව්‍යක් නිමි ද්‍රව්‍යක් බවට පත් කිරීම මෙහිදී සිදු වේ.

(II)නිවරදි පැහැදිලි කිරීමට ලකුණු ලබා දෙන්න.

(III) කර්මාන්ත සඳහා මුදල් ආයෝජනය කිරීම සඳහා තනි පුද්ගලයින් වෙනුවට සමාගම් ඉදිරිපත්ව සිටීම

ප්‍රධාන නගර අවට පිහිටි උප නගර ආශ්‍රිතව කර්මාන්ත ස්ථානගත වීම

පරිසර හිතකාමී කර්මාන්ත පවත්වාගෙන යෑම

අධිතාක්ෂණික කර්මාන්ත පර්යේෂණ ආයතන මුල්කරගෙන ව්‍යාප්ත වීම

(IV) විදේශ විනිමය ලබා දීම

රැකියා උත්පාදනය කිරීම

ප්‍රාදේශීය සංවර්ධනයක් සිදු වීම

08. (I) ආර්ථික, සමාජීය හා සංස්කෘතික බලපෑම් ලෝකයේ සියලු ප්‍රදේශවල ක්‍රමයෙන් එක හා සමාන තත්ත්වයට පත් වීමේ ක්‍රියාවලිය ගෝලීයකරණයයි.® කේම්බ්‍රිජ් ශබ්දකෝෂය (Cambridge Dictionary)

(II) තොරතුරු සන්නිවේදන තාක්ෂණය
බහු ජාතික සමාගම්
සීඝ්‍ර මානව සංචලනය

(III) වාසි

ව්‍යාවසායකයන් නොමැති රටවලට නව අදහස්, හා ව්‍යවසායකත්වය ලබා ගැනීමට ඉඩ ප්‍රස්තාව සැලසේ.
කාර්මික වශයෙන් අඩු දියුණු රටවලට ලෝකයේ විශාල වෙළෙඳපොළ කරා ප්‍රවේශ වීමට අවස්ථාව ලබා දේ.

ප්‍රාග්ධනය ගලායාම, තාක්ෂණය, මානව ප්‍රාග්ධනය ලබා ගැනීමට ඉඩ සලසන අතර ආනයන මෙන් ම අපනයන වෙළෙඳපොළ ප්‍රසාරණය කරගත හැකි වේ.

අවාසි

කාර්මික වශයෙන් දියුණු රටවල් සහ කාර්මික අඩු දියුණු රටවල් අතර මෙන් ම එම රටවල් තුළ ද ආදායම් විෂමතාව වැඩි වීම.

කාර්මික රටවල ආරක්ෂණ ප්‍රතිපත්ති සංවර්ධනය වෙමින් පවතින රටවලට අපනයන වෙළෙඳපොළ කරා ප්‍රවේශ වීමට ඇති ඉඩකඩ පාලනය කිරීම.


විදේශීය ධන ආයෝජන ආකර්ෂණය කරගැනීමේ අරමුණින් සංවර්ධනය වෙමින් පවතින රටවල් තරගකාරී ලෙස අනුගමනය කරන ක්‍රියාමාර්ග එම රටවල පාරිසරික ගැටලු ඇති කිරීමට හේතු වේ.

LOL
Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

25% OFF
ALL BOOKS

**Including Exercise Books,
CR Books, and B5 Books**



ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්

ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

Cash On Delivery Available

ORDER GCE A/L SHORT NOTES, MODEL, REVISION BOOKS & PAST PAPERS IN SINHALA, ENGLISH & TAMIL MEDIUM





LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

WHATSAPP - 0717774440

WEBSITE: WWW.LOL.LK

GET READY FOR YOUR A/Ls WITH LOL BOOK STORE!